# සත්බුදු වන්දනාව...

- **කල්ප සියයක් ඇතුළත ලොව පහළ වී වදාළ විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝණාගමන, කාශ්‍යප, ගෞතම යන සත් බුදුරජාණන් වහන්සේලා වන්දනා කරමු. උතුම් බුද්ධ පූජාවන් පවත්වමු.**

කල්ප සියයක් ඇතුළත, ලොව පහළ වී වදාළ විපස්සී නම් වූ බුදුරජාණන් වහන්සේ ද, සිඛී නම් වූ බුදුරජාණන් වහන්සේ ද, වෙස්සභූ නම් වූ බුදුරජාණන් වහන්සේ ද, කකුසඳ නම් වූ බුදුරජාණන් වහන්සේ ද, කෝණාගමන නම් වූ බුදුරජාණන් වහන්සේ ද, කාශ්‍යප නම් වූ බුදුරජාණන් වහන්සේ ද, ගෞතම නම් වූ බුදුරජාණන් වහන්සේ යන සත්බුදුරජාණන් වහන්සේලා ඒකාන්තයෙන්ම අරහං වන සේක, සම්මා සම්බුද්ධ වන සේක, විජ්ජාචරණ සම්පන්න වන සේක, සුගත වන සේක, ලෝකවිදූ වන සේක, අනුත්තරෝ පුරිසදම්ම සාරථී වන සේක, සත්ථා දේවමනුස්සානං වන සේක, බුද්ධ වන සේක, භගවා වන සේක.

ඒ සත්බුදුරජාණන් වහන්සේලා ඒකාන්තයෙන්ම අසම වන සේක. අසමසම වන සේක. අනාථනාථ වන සේක. අග්‍ර දක්ෂිණෙයය වන සේක. තුන්ලෝකාග්‍ර වන සේක. තුන්ලොව දිනූ සේක. මහා කාරුණික වන සේක. තථාගත වන සේක. තුන් ලෝකයෙහි ම ආලෝකය වන සේක. අනන්ත සිල් ඇති සේක. අනන්ත සමාධි ඇති

සේක. අනන්ත ප්‍රඥා ඇති සේක. අනන්ත විමුක්ති ඇති සේක. අනන්ත විමුක්ති ඤාණදර්ශන ඇති සේක. මහා කරුණා ඇති සේක. මහා ප්‍රඥා ඇති සේක.

මෙසේ අනන්ත වූ අප්‍රමාණ ගුණ ඇත්තා වූ, ඒ භාග්‍යවත් වූ අරහත් වූ විපස්සී නම් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පටන් ඒ භාග්‍යවත් වූ අරහත් වූ ගෞතම නම් වූ අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ දක්වා මේ කල්ප සියය ඇතුළත, ලොව පහළ වූ සත් බුදුරජාණන් වහන්සේලාට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

ඒ භාග්‍යවත් වූ අරහත් වූ සත් බුදුරජාණන් වහන්සේලා උදෙසා;

මේ බබළන පහන් ආලෝක පූජා කරමි. පූජා වේවා!

මේ පැතිරෙන සුවඳ දුම් පූජා කරමි. පූජා වේවා!

මේ සුපිපුණු සුවඳ මල් පූජා කරමි. පූජා වේවා!

මේ පිවිතුරු සිසිල් පැන් පූජා කරමි. පූජා වේවා!

මේ මිහිරි ගිලන්පස පූජා කරමි. පූජා වේවා!

මේ සුමිහිරි අෂ්ටපාන වර්ග පූජා කරමි. පූජා වේවා!

ඉතා යහපත් ලෙස පිළියෙල කරන ලද, චතුමධුර සහිත වූ සියලු පූජාවන් පූජා කරමි. පූජා වේවා!

මේ අෂ්ට පරිෂ්කාර ද පූජා කරමි. පූජා වේවා!

මේ සියලුම පූජාවෝ ඒ භාග්‍යවත් වූ අරහත් වූ විපස්සී නම් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පටන් ඒ භාග්‍යවත් වූ අරහත් වූ ගෞතම නම් වූ අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ දක්වා ලොවෙහි මහා කරුණාවෙන් වැඩසිටියා වූ, දෙව් මිනිසුන්ගේ හිතසුව පිණිස ලෝකානුකම්පාවෙන් යුතුව දහම් අමා වැසි වස්සවා

වදාළ ඒ සත් බුදුරජාණන් වහන්සේලා උදෙසා සාදර ගෞරවයෙන් පූජා කරමි. පූජා වේවා! පූජා කරමි. පූජා වේවා! පූජා කරමි. පූජා ම වේවා !

**සාදු! සාදු!! සාදු!!!**

- **අපි ඒ භාග්‍යවත් වූ අරහත් වූ විපස්සී නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේට වන්දනා කරමු :-**

මෙයට අනූඑක් කල්පයකට පෙර ලොව වාසය කළ මිනිසුන්ගේ ආයුෂ අවුරුදු අසූදාහක්ව පැවතුණා. එකල දෙවිමිනිසුන්ගේ යහපත පිණිස බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වුණා. උන්වහන්සේ විපස්සී යන නාමය ලැබුවා. උන්වහන්සේ උපන්නේ ක්ෂත්‍රිය වංශයට අයත් රජපවුලක කොණ්ඩඤ්ඤ ගෝත්‍රයේයි. උන්වහන්සේගේ පියාණන් වූයේ බන්ධුම රාජධානියෙහි රජකළ බන්ධුම රජතුමාය. මෑණියන් වූයේ බන්ධුමතී රාජ දේවියයි. උන්වහන්සේ පළොල් රුක් සෙවණකදී සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. අරහත්වයට පත් වූ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා එක් ලක්ෂ හැටඅටදහසක් පිරිවැරූ එක් මහා සංඝ සන්නිපාතයක් ද, එක් ලක්ෂයක් රහතුන් පිරිවැරූ මහා සංඝ සන්නිපාතයක් ද, අසූ දහසක් රහතුන් පිරිවැරූ මහා සංඝ සන්නිපාතයක් ද වශයෙන් සන්නිපාත තුනක් පිරිවරා වැඩසිටි සේක. අග්‍රශ්‍රාවකයන් වහන්සේලා වශයෙන් ඛණ්ඩ මහරහතන් වහන්සේ ද, තිස්ස මහරහතන් වහන්සේ ද වැඩසිටි සේක. අසෝක නමින් අග්‍රඋපස්ථායකයන් වහන්සේ නමක් වැඩසිටි සේක.

මෙසේ සම්බුද්ධත්වය ලබා දෙව්මිනිස් ලෝසතුන් හට පිළිසරණ දුන් ඒ භාග්‍යවත් වූ අරහත් වූ විපස්සී සම්මා සම්බුදුරජාණන් වහන්සේට මේ සියලුම පූජාවෝ පූජා කරමි, පූජා වෙත්වා!

01. ලොවේ ඇති හැම අඳුර නසනා
- මහා නුවණැති මුනිරජාණෙනි
සදා සැනසිලි සුවය සදනා
- ලොවේ අසදිස දම් රජාණෙනි
විපස්සී යන නමින් තිලොවේ
- වැඳුම් ලබනා බුදුරජාණෙනි
දෑත නළලේ තබා වඳිනා
- වැඳුම් පිළිගත මැන සුවාමිනි

02. නසා සියලුම කෙලෙස් සතුරන්
- ජය ලැබූ ලොව දම් රජාණෙනි
පළොල් රුක් සෙවනෙදී බුදුරැස්
- විහිදුවාලූ බුදුරජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා
- සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
- පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

## ● අපි ඒ භාග්‍යවත් වූ අරහත් වූ සිඛී නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේට වන්දනා කරමු :-

මෙයට තිස්එක් කල්පයකට පෙර ලොව වාසය කළ මිනිසුන්ගේ ආයුෂ අවුරුදු හැත්තෑදාහක්ව පැවතුණා. එකල දෙව්මිනිසුන්ගේ යහපත පිණිස බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වුණා. උන්වහන්සේ සිඛී යන නාමය ලැබුවා. උන්වහන්සේ උපන්නේ ක්ෂත්‍රිය වංශයට අයත් රජපවුලක කොණ්ඩඤ්ඤ ගෝත්‍රයේයි. උන්වහන්සේගේ පියාණන් වූයේ අරුණවතී රාජධානියෙහි රජකළ අරුණ රජතුමාය. මෑණියන් වූයේ ප්‍රභාවතී රාජ දේවියයි. උන්වහන්සේ හෙළඹ රුක් සෙවණකදී සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. අරහත්වයට පත් වූ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා ලක්ෂයක් පිරිවැරූ එක් මහා සංඝ සන්නිපාතයක් ද, අසූදහසක් රහතුන් පිරිවැරූ මහා සංඝ සන්නිපාතයක් ද, හැත්තෑ දහසක් රහතුන් පිරිවැරූ මහා සංඝ සන්නිපාතයක් ද වශයෙන් සන්නිපාත තුනක් පිරිවරා වැඩසිටි සේක. අග්‍රශ්‍රාවකයන් වහන්සේලා වශයෙන් අභිභූ මහරහතන් වහන්සේ ද, සම්භව මහරහතන් වහන්සේ ද වැඩසිටි සේක. ඛේමංකර නමින් අග්‍රඋපස්ථායකයන් වහන්සේ නමක් වැඩසිටි සේක.

මෙසේ සම්බුද්ධත්වය ලබා දෙව්මිනිස් ලෝසතුන් හට පිළිසරණ දුන් ඒ භාග්‍යවත් වූ අරහත් වූ සිඛී සම්මා සම්බුදුරජාණන් වහන්සේට මේ සියලුම පූජාවෝ පූජා කරමි, පූජා වෙත්වා!

01. හෙළඹ රුක් සෙවණෙදී බුදුරැස්
- විහිදුවාලූ මුනිරජාණෙනි

බිම්බරක් දස මාර සේනා
- පරදවාලූ වීරයාණෙනි
සිඛී යන නාමයෙන් තිලොවේ
- පිදුම් ලබනා බුදුරජාණෙනි
දෑත නළලේ තබා වඳිනා
- වැඳුම් පිළිගත මැන සුවාමිනි

02. ලොවේ ඇති දුක් තැවුල් නිවනා
- කාරුණික සම්බුදුරජාණෙනි
නුවණ වසනා අඳුර නසනා
- මහා නුවණැති ගුණවතාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා
- සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
- පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

## • අපි ඒ භාග්‍යවත් වූ අරහත් වූ වෙස්සභූ නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේට වන්දනා කරමු :-

මෙයට තිස්එක් කල්පයකට පෙර ලොව වාසය කළ මිනිසුන්ගේ ආයුෂ අවුරුදු හැටදාහක්ව පැවතුණා. එකල දෙවිමිනිසුන්ගේ යහපත පිණිස බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වුණා. උන්වහන්සේ වෙස්සභූ යන නාමය ලැබුවා. උන්වහන්සේ උපන්නේ ක්ෂත්‍රිය වංශයට අයත් රජපවුලක කොණ්ඩඤ්ඤ ගෝත්‍රයේයි. උන්වහන්සේගේ පියාණන් වූයේ අනෝම රාජධානියෙහි

රජකළ සුප්පතීත රජතුමාය. මෑණියන් වූයේ යසවතී රාජ දේවියයි. උන්වහන්සේ සල් රුක් සෙවණකදී සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. අරහත්වයට පත් වූ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා අසූ දහසක් පිරිවැරූ එක් මහා සංඝ සන්නිපාතයක් ද, හැත්තෑදහසක් රහතුන් පිරිවැරූ මහා සංඝ සන්නිපාතයක් ද, හැට දහසක් රහතුන් පිරිවැරූ මහා සංඝ සන්නිපාතයක් ද වශයෙන් සන්නිපාත තුනක් පිරිවරා වැඩසිටි සේක. අග්‍රශ්‍රාවකයන් වහන්සේලා වශයෙන් සෝණ මහරහතන් වහන්සේ ද, උත්තර මහරහතන් වහන්සේ ද වැඩසිටි සේක. උපසන්ත නමින් අග්‍රඋපස්ථායකයන් වහන්සේ නමක් වැඩසිටි සේක.

මෙසේ සම්බුද්ධත්වය ලබා දෙව්මිනිස් ලෝසතුන් හට පිළිසරණ දුන් ඒ භාග්‍යවත් වූ අරහත් වූ වෙස්සභූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මේ සියලුම පූජාවෝ පූජා කරමි, පූජා වෙත්වා!

01. වෙස්සභූ යන නමින් තිලොවේ
- එළිය කරනා බුදුරජාණෙනි
සාල රුක් සෙවණෙදී බුදුරැස්
- විහිදුවාලූ සිහ රජාණෙනි
සියලු ලෝ සත වෙත දයාවෙන්
- නිවන් සැප දුන් බුදුපියාණෙනි
දෑත නළලේ තබා වඳිනා
- වැඳුම් පිළිගත මැන සුවාමිනි

02. සිල් සමාහිත නුවණ පැතිරූ
- වෙස්සභූ සම්බුදුරජාණෙනි
මිහිරි සදහම් සුවය සැලසූ
- ලොවේ අසදිස දම් රජාණෙනි

මල් පහන් හා සුවඳ දුම් හා
- සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
- පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

- **අපි ඒ භාග්‍යවත් වූ අරහත් වූ කකුසඳ නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේට වන්දනා කරමු :-**

මේ මහා භද්‍ර කල්පයේ ලොව වාසය කළ මිනිසුන්ගේ ආයුෂ අවුරුදු හතළිස්දහසක්ව පැවතුණා. එකල දෙව්මිනිසුන්ගේ යහපත පිණිස බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වුණා. උන්වහන්සේ කකුසඳ යන නාමය ලැබුවා. උන්වහන්සේ උපන්නේ බ්‍රාහ්මණ වංශයට අයත් කාශ්‍යප ගෝත්‍රයේයි. උන්වහන්සේගේ පියාණන් වූයේ ක්ෂේමවතී රාජධානියේ අග්ගිදත්ත පුරෝහිත බ්‍රාහ්මණතුමාය. මෑණියන් වූයේ විසාඛා බ්‍රාහ්මණතුමියයි. උන්වහන්සේ මහරි රුක් සෙවණකදී සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. අරහත්වයට පත් වූ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා හතළිස් දහසක් රහතුන් පිරිවැරූ මහා සංඝ සන්නිපාතයක් පිරිවරා වැඩසිටි සේක. අග්‍රශ්‍රාවකයන් වහන්සේලා වශයෙන් විධුර මහරහතන් වහන්සේ ද, සංජීව මහරහතන් වහන්සේ ද වැඩසිටි සේක. බුද්ධිජ නමින් අග්‍රඋපස්ථායකයන් වහන්සේ නමක් වැඩසිටි සේක.

මෙසේ සම්බුද්ධත්වය ලබා දෙව්මිනිස් ලෝසතුන් හට පිළිසරණ දුන් ඒ භාග්‍යවත් වූ අරහත් වූ කකුසඳ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මේ සියලුම පූජාවෝ පූජා කරමි, පූජා වෙත්වා!

01. උදා හිරු ලොව දිලෙන විලසින්
- ලොවට වඩිනා බුදුරජාණෙනි
මහරි රුක් සෙවණෙදී බුදුරැස්
- විහිදුවාලූ දම් රජාණෙනි
නමින් කකුසඳ ලෙසින් තිලොවේ
- වැඳුම් ලබනා මුනිරජාණෙනි
දෑත නළලේ තබා වඳිනා
- වැඳුම් පිළිගත මැන සුවාමිනි

02. හඬා වැළපෙන ලොවට සැනසුම
- බෙදා දෙන සම්බුදුරජාණෙනි
අමා සැප ඇති නිවන් සැප දෙන
- කාරුණික සම්බුදු රජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා
- සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
- පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

## ● අපි ඒ භාග්‍යවත් වූ අරහත් වූ කෝණාගමන නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේට වන්දනා කරමු:-

මේ මහා භද්‍ර කල්පයේ ලොව වාසය කළ මිනිසුන්ගේ ආයුෂ අවුරුදු තිස්දහසක්ව පැවතුණා. එකල දෙව්මිනිසුන්ගේ යහපත පිණිස බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වුණා. උන්වහන්සේ කෝණාගමන යන නාමය ලැබුවා. උන්වහන්සේ උපන්නේ බ්‍රාහ්මණ වංශයට අයත් කාශ්‍යප ගෝත්‍රයේයි. උන්වහන්සේගේ පියාණන් වූයේ සෝභාවතී රාජධානියේ යඤ්ඤදත්ත පුරෝහිත බ්‍රාහ්මණතුමාය. මෑණියන් වූයේ උත්තරා බ්‍රාහ්මණතුමියයි. උන්වහන්සේ දිඹුල් රුක් සෙවණකදී සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. අරහත්වයට පත් වූ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා තිස් දහසක් රහතුන් පිරිවැරූ මහා සංඝ සන්නිපාතයක් පිරිවරා වැඩසිටි සේක. අග්‍රශ්‍රාවකයන් වහන්සේලා වශයෙන් භියෝස්ස මහරහතන් වහන්සේ ද, උත්තර මහරහතන් වහන්සේ ද වැඩසිටි සේක. සොත්ථිජ නමින් අග්‍රඋපස්ථායකයන් වහන්සේ නමක් වැඩසිටි සේක.

මෙසේ සම්බුද්ධත්වය ලබා දෙව්මිනිස් ලෝසතුන් හට පිළිසරණ දුන් ඒ භාග්‍යවත් වූ අරහත් වූ කෝණාගමන සම්මා සම්බුදුරජාණන් වහන්සේට මේ සියලුම පූජාවෝ පූජා කරමි, පූජා වෙත්වා!

01. දෙව්මිනිස් ලොව එළිය කරනා
    - මහා නුවණැති මුනිරජාණෙනි
දිඹුල් රුක් සෙවණෙදී බුදුරැස්
    - විහිදුවාලූ දම් රජාණෙනි
නමින් කෝණාගමන ලෙස ලොව
    - වැඳුම් ලබනා ගුණවතාණෙනි

දෑත නළලේ තබා වඳිනා
- වැඳුම් පිළිගත මැන සුවාමිනි

02. මහා කරුණා නෙතින් බලනා
- කාරුණික සම්බුදු රජාණෙනි
වළාකුළු නැති අහසෙ දිලෙනා
- සුපුන් සඳ වන් පින්වතාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා
- සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
- පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

- **අපි ඒ භාග්‍යවත් වූ අරහත් වූ කාශ්‍යප නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේට වන්දනා කරමු :-**

මේ මහා භද්‍ර කල්පයේ ලොව වාසය කළ මිනිසුන්ගේ ආයුෂ අවුරුදු විසිදහසක්ව පැවතුණා. එකල දෙවිමිනිසුන්ගේ යහපත පිණිස බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වුණා. උන්වහන්සේ කාශ්‍යප යන නාමය ලැබුවා. උන්වහන්සේ උපන්නේ බ්‍රාහ්මණ වංශයට අයත් කාශ්‍යප ගෝත්‍රයේයි. උන්වහන්සේගේ පියාණන් වූයේ බරණැස් රාජධානියේ බ්‍රහ්මදත්ත පුරෝහිත බ්‍රාහ්මණතුමාය. මෑණියන් වූයේ ධනවතී බ්‍රාහ්මණතුමියයි. උන්වහන්සේ නුග රුක් සෙවණකදී සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. අරහත්වයට පත් වූ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා විසි දහසක් රහතුන් පිරිවැරූ මහා සංඝ

සන්නිපාතයක් පිරිවරා වැඩසිටි සේක. අග්‍රශ්‍රාවකයන් වහන්සේලා වශයෙන් තිස්ස මහරහතන් වහන්සේ ද, භාරද්වාජ මහරහතන් වහන්සේ ද වැඩසිටි සේක. සර්වමිත්‍ර නමින් අග්‍රඋපස්ථායකයන් වහන්සේ නමක් වැඩසිටි සේක.

මෙසේ සම්බුද්ධත්වය ලබා දෙව්මිනිස් ලෝසතුන් හට පිළිසරණ දුන් ඒ භාග්‍යවත් වූ අරහත් වූ කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේට මේ සියලුම පූජාවෝ පූජා කරමි, පූජා වෙත්වා!

01. සදාකාලික සුවය සදනා
- කාරුණික සම්බුදුරජාණෙනි
නුග රුකක් සෙවණෙදී බුදුරැස්
- විහිදුවාලූ සිහ රජාණෙනි
නිවා හැම දුක් තැවුල් තිලොවේ
- අමා සැප දුන් මුනිරජාණෙනි
දෑත නළලේ තබා වඳිනා
- වැඳුම් පිළිගත මැන සුවාමිනි

02. ලොවට සැනසුම පතාගෙන වැඩි
- තථාගත සම්බුදුරජාණෙනි
සැමට යහපත උදාකරනා
- කාරුණික සම්බුදු රජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා
- සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
- පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**

- **අපි ඒ භාග්‍යවත් වූ අරහත් වූ ගෞතම නම් වූ අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේට වන්දනා කරමු :-**

මේ මහා භද්‍ර කල්පයේ මින් දෙදහස් හයසිය වසරකට පෙර ලොව වාසය කළ මිනිසුන්ගේ ආයුෂ අවුරුදු එකසිය විස්සක්ව පැවතුණා. එකල දෙව්මිනිසුන්ගේ යහපත පිණිස බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වුණා. උන්වහන්සේ ගෞතම නම් වූ අපගේ බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේ උපන්නේ ක්ෂත්‍රිය වංශයට අයත් ගෞතම ගෝත්‍රයේයි. උන්වහන්සේගේ පියාණන් වූයේ කපිලවස්තු රාජධානියේ සුද්ධෝදන රජතුමාය. මෑණියන් වූයේ මහාමායා බිසවුන් වහන්සේය. උන්වහන්සේ ඇසතු රුක් සෙවණකදී සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. අරහත්වයට පත් වූ ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා එක්දහස් දෙසිය පණස් නමක් රහතුන් පිරිවැරූ මහා සංඝ සන්නිපාතයක් පිරිවරා වැඩසිටි සේක. අග්‍රශ්‍රාවකයන් වහන්සේලා වශයෙන් සාරිපුත්ත මහරහතන් වහන්සේ ද, මහා මොග්ගල්ලාන මහරහතන් වහන්සේ ද වැඩසිටි සේක. ආනන්ද නමින් අග්‍රඋපස්ථායකයන් වහන්සේ නමක් වැඩසිටි සේක.

මෙසේ සම්බුද්ධත්වය ලබා දෙව්මිනිස් ලෝසතුන් හට පිළිසරණ දුන් ඒ භාග්‍යවත් වූ අරහත් වූ ගෞතම නම් වූ අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මේ සියලුම පූජාවෝ පූජා කරමි, පූජා වෙත්වා!

01. පුරා දස පාරමී ගුණදම්
- ලොවට වැඩි මහා ගුණවතාණෙනි

ඇසතු රුක් සෙවණෙදී බුදුරැස්
- විහිදුවාලූ දම්රජාණෙනි
නමින් ගෞතම ලෙසින් තිලොවේ
- වැඳුම් ලබනා මුනිරජාණෙනි
දෑත නළලේ තබා වඳිනා
- වැඳුම් පිළිගත මැන සුවාමිනි

02. අඳුරු වූ ලොව එළිය කරනා
- මහා නුවණැති බුදුරජාණෙනි
අපට සැනසිලි සුවය සදනා
- පිහිට ඔබමයි බුදුරජාණෙනි
මල් පහන් හා සුවඳ දුම් හා
- සිසිල් පැන් හා මේ ගිලන්පස
පුදමි සම්බුදු පියාණෙනි මම
- පතාගෙන ඒ අම නිවන් සුව

**සාදු! සාදු!! සාදු!!!**